# 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ මව්බස ලිවීමේ අඩු සාධන මට්ටමක් පෙන්නුම් කිරීම හා එම සිසුන්ගේ එවැනි තත්ත්වයන් කෙරෙහි බලපාන හේතු අධ්‍යයනය කිරීමක්.

**ඩී.එම්. නාලනී කාන්ති කුමාරි.**

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ
විද්‍යා පීඨයේ අධ්‍යාපනපති පශ්චාත් උපාධිය සඳහා
ඉදිරිපත් කරන නිබන්ධනය.

REFERENCE ONLY

**1998/1999**

64696

## සාරාංශය

6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් ගේ මව්බස ලිවීමේ අඩු සාධන මට්ටමක් පෙන්නුම් කිරීම හා එම සිසුන්ගේ එවැනි තත්ත්වයක් කෙරෙහි බලපාන හේතු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ගැටළුව විය.

පළමු පරිච්ඡේදයේදී ගැටළුවට මුල් වූ පසුබිම පැහැදිලි කරමින් එම ගැටළුව මතු වූ ආකාරය විස්තර කෙරිණි. එසේම එම ගැටළුව අධ්‍යයනය කිරීමෙන් අපේක්ෂිත ප්‍රයෝජන ද එම අධ්‍යයනයේ වැදගත්කම හා අධ්‍යයනය හඳුන්වීම ද මෙහිදී සිදු විය.

දෙවන පරිච්ඡේදයේදී පර්යේෂණය ඉදිරියට දියත් කිරීම සඳහා මග පෙන්වනු ලැබූ සාහිත්‍ය විමර්ශනයක් කෙරී ඇත. දේශීය හා විදේශීය විද්වතුන් විසින් මෙම පර්යේෂණ ගැටළුවට අදාළ හෝ එයට ආසන්නව සිදු කර ඇති අධ්‍යයන තුළින් අනාවරණය කර ගන්නා ලද තොරතුරු එහිදී ඉදිරිපත් කෙරිණි. එය ඉදිරිපත් වූයේ,

- × භාෂාව යනු කුමක්ද?
- × භාෂාවේ වැදගත්කම.
- × ලිවීම.
- × ව්‍යාකරණානුකූලව ලිවීමේ අවශ්‍යතාවය හා වැදගත්කම.
- × නිර්මාණාත්මකව ලිවීමේ අවශ්‍යතාවය හා වැදගත්කම.
- × සාධනය යනු කුමක්ද?
- × සාධන පරීක්ෂණ.
- × සාධන අවශ්‍යතාවය යන අනුබද්ධමාතෘකාවලට අදාළවය.

තුන්වන පරිච්ඡේදයෙන් විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ගැටළුව හඳුන්වීම පළමුව සිදු වූ අතර අධ්‍යයන අරමුණු ඉදිරිපත් කිරීමද, නියැදිය තෝරා ගැනීම පිළිබඳ විස්තර කිරීමද, දත්ත රැස් කිරීමේ ක්‍රම ශිල්ප පිළිබඳ පැහැදිලි කිරීමක් ද ඉන් පසුව විය.

එහිදී සාධන පරීක්‍ෂණ ප්‍රශ්න පත්‍රය සකස් කිරීම පිළිබඳ කරුණු විස්තර කිරීමක් ද, නියෝජිත නියැදියේ ළමුන්ගේ දෙමව්පියන් සඳහා සකස් කරන ලද ප්‍රශ්නාවලිය පිළිබඳ පැහැදිලි කිරීමක් ද, එම නියැදියේ සිසුන් සඳහා සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා ප්‍රශ්නාවලිය පිළිබඳ කරුණු දැක්වීමක් ද සිදු විය. පසුව එම සිසුන් ගේ පාසල් භෞතික පරිසරය හා සම්පත් ප්‍රමාණය, අභ්‍යාස පොත් හා වෙනත් සටහන් පසුගිය සාධන ලකුණු ආදිය ලබා ගැනීම විස්තර කෙරිණි. දත්ත විශ්ලේෂණ ක්‍රම හා පර්යේෂණ සීමා පිළිබඳ තොරතුරු අනාවරණය කෙරුණේ ද මෙම පරිච්ඡේදයේ දී ය.

හතර වන පරිච්ඡේදයේදී දත්ත විශ්ලේෂණය සිදු විය. සිසුන් සඳහා දෙනු ලැබූ සාධන පරීක්‍ෂණ ප්‍රශ්න පත්‍රය උපලේඛන අංක IV මඟින් දැක්වූ අතර ඒ සඳහා සිසුන් ලැබූ ලකුණු ලැයිස්තුවද එම ලකුණුවලට අදාලව ගොඩනැගුණු සංඛ්‍යාත වගුවද, සංඛ්‍යාත බහු අශ්‍රය හා ජාල රේඛය ද ප්‍රස්ථාර ගත කර දැක්විණි. එම පරීක්‍ෂණයෙන් අඩුම ලකුණු ලැබූ සිසුන් දෙදෙනෙකුගේ හා වැඩීම ලකුණු ලැබූ සිසුන් දෙදෙනෙකුගේ ද පිළිතුරු පත් ද ඉදිරිපත් කෙරිණි. එම පරීක්‍ෂණයෙන් හඳුනා ගත් භාෂාව ලිවීමේ දුර්වලතා සංඛ්‍යාත්මක පෙන්වා ඇති අතර නියැදියේ සිසුන් 25 දෙනා ඒ ඒ ප්‍රශ්නය සඳහා ලබාගත් ලකුණු පිළිබඳ මනු විශ්ලේෂණයක් ද උපලේඛන අංක VIII මඟින් දක්වා ඇත. ඉන් අනතුරුව ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ඡා මඟින් ලබා ගත් තොරතුරු

× දෙමව්පිය පරිසරය.

× පවුල් පරිසරය

× පාසල් පරිසරය යටතේ පෙන්නුම් කරනු ලැබීය. දත්ත අර්ථකථනය සිදු වූයේ ද එම පරිච්ඡේදියේදීය.

× සිසුන්ගේ අඩු සාධනයට ස්ත්‍රී/පුරුෂ භාවය බලපෑම.

× අඩු සාධන මට්ටම කෙරෙහි පාසල් වර්ගයේ බලපෑම.

× දෙමව්පිය පරිසරය හා පවුල් පරිසරය අඩු සාධනයට බලපෑම.

× පන්ති කාමර පරිසරය අඩු සාධනයට බලපෑම යන අනු මාතෘකා යටතේ ලබා ගන්නා ලද දත්තයන් අර්ථකථනය මෙහිදී විය.

පස් වැනි පරිච්ඡේදයේදී එම පර්යේෂණ අධ්‍යයනය තුළින් එළැඹුණු නිගමනයන් ද එවැනි දුර්වලතා පෙන්නුම් කළ සිසුන්ට ලිවීමේ කාර්යය දියුණු කර ගැනීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම ද සිදු කෙරිනි.

OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY